පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සතිපාසල

සතිය -

විෂයය :- සිංහල

ශ්‍රේණිය :- 11

Prepared by - කලාප අධ්‍යාපන කාර්යාලය, කෑගල්ල

01. න, ණ, ල, ළ භේදය හා නිවැරදි ශ, ෂ, ස භාවිතය හා අල්ප්‍රාණ මහාප්‍රාණ අකුරු, සඤ්ඤක, නාසික්‍ය, අන්තඃස්ථාක්ෂර, ඌෂ්මාක්ෂර, කණ්ඨජ, තාලුජ, මූර්ධජ, දන්තජ, ඕෂ්ඨජ යන අක්ෂර වර්ගීකරණය පදනම් කර ගෙන මෙම ප්‍රශ්නය සකස් වේ.

අක්ෂර මාලාව සම්පූර්ණ කරන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| | | ඇ | | | ඊ |
| | | | ඎ | | |
| එ | | | | ඕ | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | අඃ | | | | |
| | ඛ | | | | ග |
| | | | ඬ | | |
| | ඨ | | | | |
| | | | | න | |
| | | | භ | | |
| | | ල | | | |
| ශ | | | | ළ | |

අක්ෂර මාලාවෙහි හිස්තැන් පුරවා අක්ෂර මාලාව පිළිබඳ ඔබේ දැනුම ප්‍රගුණ කර ගන්න.

ප්‍රශ්න :

01. ස්වර අක්ෂර කීයද?
02. ව්‍යඤ්ජන අක්ෂර කීයද?
03. මහප්‍රාණ අක්ෂර කීයද? ඒ මොනවාද?
04. අල්ප්‍රාණ අක්ෂර කීයද? ඒ මොනවාද?
05. සඤ්ඤක අක්ෂර කීයද? ඒ මොනවාද?

06. අන්තඃස්ථ අක්ෂර ලියන්න.
07. ඌෂ්ම අක්ෂර නම් කරන්න.
08. හ්‍රස්ව ස්වර ලියන්න.
09. දීර්ඝ ස්වර නම් කරන්න.
10. නම්‍ය ස්වර නම් කරන්න.
11. අනම්‍ය ස්වර නම් කරන්න.
12. ඝෝෂ අක්ෂර නම් කරන්න.
13. අඝෝෂ අක්ෂර නම් කරන්න.
14. කණ්ඨජ අක්ෂර නම් කරන්න.
15. තාලුජ අක්ෂර නම් කරන්න.
16. මූර්ධජ අක්ෂර නම් කරන්න.
17. දන්තජ අක්ෂර නම් කරන්න.
18. ඕෂ්ඨජ අක්ෂර නම් කරන්න.
19. විසර්ගය සහිත වචන 2 ක් ලියන්න.
20. අනුස්වාරය සහිත වචන 2 ක් ලියන්න.